CSE Academy

CSE

කොළඹ කොටස් හුවමාරුව

*ධනය හා වටිනාකම් උත්පාදනය උදෙසා*

# කොළඹ කොටස් හුවමාරුව අධ්‍යාපනික ඇකඩමිය කථිකාචාර්යවරුන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවීම (ඉංග්‍රීසි / සිංහල / දෙමළ)

කොළඹ කොටස් හුවමාරුව (CSE) යනු ශ්‍රී ලංකාව තුළ කොටස් හුවමාරු කිරීමෙහි ක්‍රියාකරු වන අතර, එමගින් එහි පාර්ශ්වකරුවන් සඳහා ගණුදෙනු වලදී පූර්ව ගණුදෙනු, ගණුදෙනු සහ පසු ගණුදෙනු සඳහා පහසුකම් සපයනු ලබයි. විශේෂයෙන්ම මෑත වසරවලදී කොළඹ කොටස් හුවමාරුව සිය ආයෝජක පදනම පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

කොළඹ කොටස් හුවමාරුව, උපායමාර්ගික ව්‍යාපාරික ඒකකයක් ලෙස CSE අධ්‍යාපන ඇකඩමිය පිහිටුවීම මගින්, ශ්‍රී ලාංකික ප්‍රජාව අතර මූල්‍ය වෙළෙඳපොළ පිළිබඳ දැනුම ප්‍රචලිත කිරීම සහ මූල්‍ය සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම පිළිබඳව කොටස් වෙළෙඳපොළ ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරන ලදී. CSE අධ්‍යාපන ඇකඩමිය, කොළඹ, මීගමුව, පානදුර, අනුරාධපුරය, යාපනය, මඩකලපුව, කුරුණෑගල, මහනුවර, මාතර, අම්බලන්තොට සහ රත්නපුර පිහිටා ඇති සිය ශාඛා ජාලය හරහා පුළුල් පරාසයක අධ්‍යාපනික වැඩසටහන් ඉදිරිපත් කරනු ලබයි.

CSE අධ්‍යාපන ඇකඩමියේ අධ්‍යාපන වැඩසටහන් සඳහා පළපුරුදු අධ්‍යාපනඥයන් සහ වෘත්තිකයන් බාහිර කථිකාචාර්යවරුන් ලෙස ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවීම ආරම්භ කර ඇත. ඔබත් මූල්‍ය වෙළෙඳපොළ ක්ෂේත්‍රය පිළිබඳව සුදුසුකම් සහිත පළපුරුදු අයෙක් නම් අප සමඟ සම්බන්ධ විය හැකිය.

## අධ්‍යාපනික සුදුසුකම්:

1. අවම වශයෙන් ව්‍යාපාර කළමනාකරණය / ආර්ථික විද්‍යාව / මූල්‍ය / ගණකාධිකරණ හෝ මූල්‍ය වෙළෙඳපොළ පිළිබඳව ආශ්‍රිත ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් හෝ
2. ව්‍යාපාර කළමනාකරණය / ආර්ථික විද්‍යාව / මූල්‍ය / ගණකාධිකරණය හෝ මූල්‍ය වෙළෙඳපොළ ආශ්‍රිත ක්ෂේත්‍රයක උපාධියක් සමඟ CA, CIMA, ACCA, CFA / CIM / SLIM හෝ වෙනත් පිළිගත් වෘත්තීය සුදුසුකමක පූර්ණ හෝ අර්ධ වශයෙන් සුදුසුකම් ලබා තිබීම.

## වෙනත් සුදුසුකම්:

1. අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 5 ක වෘත්තීය පළපුරුද්දක්
2. ඵලදායී ඉගැන්වීම් සහ ශිෂ්‍ය කළමනාකරණය පිළිබඳ, අවම වශයෙන් වසර 1 ක ඉගැන්වීමේ අත්දැකීම්
3. භාෂා ප්‍රවීණතාවය සමඟ විශිෂ්ට වාචික හා ලිඛිත සන්නිවේදන කුසලතා අත්දැකීම්
4. විද්‍යුත් ඉගැන්වීම් ක්‍රමවේද (E- Learning Platform) පිළිබඳ අත්දැකීම් අමතර වාසියක් වනු ඇත
5. ගෝලීය හා දේශීය ව්‍යාපාරික සහ ආර්ථික කටයුතු පිළිබඳ යාවත්කාලීන දැනුම

**ආකර්ෂණීය වැටුප් පදනමක් මත සුදුසු අපේක්ෂකයින්ට වැටුප් ගෙවීම් සිදු කරනු ලැබේ.**

ඔබත් සුදුසුකම් සහිත අයදුම්කරුවකු නම් යාවත්කාලීන කරන ලද ජීවදත්ත පත්‍රිකාවක් ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ තොරතුරු සමඟ srima@cse.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට අගෝස්තු 15 වන දිනට හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය.